විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මහලේකම් කාර්යාලය, මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. : විවැ/චක්‍රලේඛ/2011 දිනය / திகதி / Date : 2011-05-05

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 15/ 2009 (සංශෝධන I)**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,**
**පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,**
**දෙපාර්තමේන්තු ප්‍රධානීන්,**
**දිසා ලේකම්වරුන්/ ප්‍රාදේශීය ලේකම්වරුන්,**

## විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීම

විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සහ විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කිරීමට අදාලව මවිසින් නිකුත් කරන ලද 2009- 08- 21 දිනැති විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු චක්‍රලේඛ 15/ 2009 ට වැඩිමනක් වශයෙනි.

රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් විශ්‍රාම ලබා, කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීම සඳහා ඔහු/ ඇය වෙනුවෙන් නිකුත් කරනු ලබන පත්වීම් ලිපියේ වැටුප් වර්ධක අගයන් ලබාදෙන බවට සඳහන් කර ඇත්තේ නම් පමණක් වැටුප් වර්ධක අගය ගණනය කොට විශ්‍රාම වැටුප් ප්‍රතිශෝධනය කළ හැකිය. කෙසේ වෙතත්, පත්වීම් ලිපියේ වැටුප් වර්ධක ලබාදීම සම්බන්ධව සඳහන් කොට නොමැති විට වැටුප් වර්ධක අගය ගණනය කිරීමකින් තොරව විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනය කළ යුතුය.

එමෙන්ම විශ්‍රාම වැටුප ප්‍රතිශෝධනයට අඛණ්ඩව වසර 02 ක් සේවය කිරීම අත්‍යාවශ්‍ය වන බවද කාරුණිකව දන්වමි.

කේ. ඒ. තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02. ලේකම් - මුදල් අමාත්‍යාංශය.
03. විගණකාධිපති.
04. ප්‍රධාන ගණකාධිකාරී - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව.

| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk